පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 06 |

# දෙවන වාර පරීක්ෂණය - 2019

## නාට්‍ය හා රංගකලාව- I, II

පාසලේ නම : ..............................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..............................................
..............................................

කාලය : පැය 2 යි.

## I – පත්‍රය

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

01. අනුකරණය සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.
    i. ගීතයකට නැටීමය. ii. දෙබස් ඛණ්ඩයක් පැවසීමය.
    iii. දෙයක් ඒ ආකාරයෙන්ම කර පෙන්වීමය. iv. ගීතයක් ගායනා කිරීමය.

02. පංති කාමරයට සර්පයෙකු පැමිණි අවස්ථාවේ නිමල් වහා ක්‍රියාත්මක වී සර්පයා පලවා හැරි නිසා වන්නට තිබූ අනතුරකින් අනෙක් සිසුන් බේරා ගැනිමට හැකි විය. නිමල්ට මෙය සිදු කිරීමට හැකි වූයේ නාට්‍ය හා රංගකලාව විෂයට අදාලව සිදු කළ,
    i. අභිරූපණ අභ්‍යාස නිසාය. ii. ක්ෂණික නිරූපණ අභ්‍යාස නිසාය.
    iii. තාපන අභ්‍යාස නිසාය. iv. දර්පන අභ්‍යාස නිසාය.

03. භූමිකාවක් යනු,
    i. චරිතයක පැතිකඩයි. ii. රඟපාන වේදිකාවයි.
    iii. චරිත නිරූපනයයි. iv. චරිතයකට අනුව හැඩගැස්වීමයි.

04. ගුණාත්මක හා නිර්මාණාත්මක බවින් ඉහළ නිර්මාණයක් බිහිකිරීම සඳහා අවශ්‍ය වන්නේ.
    i. සතර අභිනයයි. ii. රංග අභ්‍යාසයයි.
    iii. භූමිකා රංගනයයි. iv. පරිකල්පන ශක්තියයි.

05. ළමා නාට්‍යයකි.
    i. රතුහැට්ටකාරි. ii. පුංචි භූතයා.
    iii. සෙල්ලම් ගෙදර. iv. නෙළුම් කුමාරි.

- 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුර යා කරන්න.

| | |
| --- | --- |
| 06. ළමා ගීතයකි | ආලෙ බැන්ද මාගෙ රම්‍ය වන් |
| 07. නාට්‍ය ගීතයකි | රත්න දිප ජන්ම භූමි |
| 08. චිත්‍රපට ගීතයකි | සොම්නස හෝ සන්තාපය හමුවේ |
| 09. මව්ගුණ ගීතයකි | ඉරෙන් හඳෙන් එළිය අරන් |
| 10. දේශාභිමානී ගීතයකි | මොනවද මුත්තේ මොකද කරන්නේ |

Education NCP - www.edncp.lk

11. ළමා නාට්‍ය අධ්‍යක්ෂවරයෙකි,

i. දයානන්ද ගුණවර්ධන මහතා
ii. පාලිත ලොකුපෝතාගම මහතා
iii. සුගතපාල ද සිල්වා මහතා
iv. ජයලත් මනෝරත්න මහතා

12. ගුවන්විදුලි නාට්‍යයකි.

i. සූරිය අරණ
ii. අලිපැටියෝ ඔයයි මමයි
iii. දුවන ළමයා
iv. මුවන් පැලැස්ස

13. පහත දී ඇති ග්‍රන්ථ අතුරින් විදේශීය ජනකතා පමණක් ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

i. ජනකවි ආශ්‍රිත ජනකතා
ii. ශ්‍රී ලංකාවේ ජනකතා එකතුව
iii. ඊසොප් ගේ උපමා කතා
iv. වයඹ ජනකතා

14. අධිමානුෂීය චරිත ඇතුළත් කතා පුවතකි.

i. ඇලඩින්ගේ පුදුම පහන
ii. අහස කඩා වැටීම
iii. වී බිස්ස
iv. නාඩි බැලීම

15. "දී කිරි දී කිරි ගෙනාවා දී කිරි" ගීත ඛණ්ඩය ඇතුළත් නාට්‍ය,

i. විකෘති
ii. නරිබෑණා
iii. තාරාවෝ ඉගිලෙති
iv. රතු හැට්ටකාරි

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වරහන තුළ දී ඇති වචන අතුරින් හිස්තැනට සුදුසු වචනය තෝරා ලියන්න.

සරල ජනකතාවක් ඇසුරින් නිෂ්පාදනය වූ (16) ..................................................... නාට්‍යයේ සත්ත්ව චරිතයක් ලෙස (17)................................................ වේදිකාවට පැමිණේ. මේ අවස්ථාවේ දී ගමදුව කැලයට ගොස් දර කඩන ආකාරය (18)................................................ දක්වයි. ඇය එම අවස්ථාවේ දී (19) ........................................... ගීතය ගායනා කරමින් රංගනයේ යෙදෙයි. මෙම අවස්ථාවේ වේදිකාවේ පසුතලය ලෙස (20) ........................................................ යොදා ගනී.

(ආංගික අභිනයෙන්, නරිබෑණා , පඳුරක්, නරියා , ඇහැළ මලින්)

( ලකුණු 2 × 20 = 40 )

Education NCP - www.edncp.lk

**සැ:යු** • **පහත දී ඇති ප්‍රශ්න අතරින් පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. "පුංචි කතාවක් කියන්න
පුංචි අපට සවන් දෙන්න
පුංචි පුංචි වැරදි ඇතොත්
පුංචි අපට සමාවෙන්න......"

i. ඉහත ගී ඛණ්ඩය ඇතුළත් නාට්‍ය කුමක්ද? (ලකුණු 02)

ii. ඉහත නාට්‍ය අධ්‍යක්ෂණය කළේ කවුරුන්ද? (ලකුණු 02)

iii. එම අධ්‍යක්ෂවරියගේ වෙනත් නාට්‍ය 02 ක් නම් කරන්න. (ලකුණු 02)

iv. මෙම නාට්‍යයේ එන කුකුල්හාමි මී පැටවුන්ට කළ උදව් 02 ක් ලියන්න. (ලකුණු 02)

v. කුකුල්හාමි නියමිත වෙලාවට වැඩකරන බව හැඟවෙන නාට්‍යයේ සඳහන් වන කවිය ලියන්න. (ලකුණු 02)

vi. කුකුල්හාමි නිවසට පැමිණෙන අවස්ථාවේ දී මී පැටවුන් සිදුකරන ක්‍රියාවන් 2 ක් ලියන්න. (ලකුණු 02)

02.



A



B



C



D

i. ඉහත රූප සටහන් මගින් දක්වෙන සිදුවීම් අනුපිළිවෙලින් දක්වන්න. (ලකුණු 02)

ii. ඉහත පෙළගැස් වූ සිදුවීම් ඇසුරින් කතාවක් ගොඩනගන්න. (ලකුණු 04)

iii. ඔබ අසා ඇති විදේශිය ජනකතාවක් ලියන්න. (ලකුණු 06)

03. i. ඔබේ ශරීරයේ සංවේදන ඉන්ද්‍රියයන් 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. සංවේදන ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් නළුවාට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න. (ලකුණු 04)

iii. ඔබ පංතිකාමරයේ දී සංවේදන ඉන්ද්‍රියන් සඳහා සිදුකළ ක්‍රියාකාරකමක් පියවර වශයෙන් ලියන්න. (ලකුණු 06)

Education NCP - www.edncp.lk

04. i. ඔබ පංතිකාමරයේ දී විවිධ හඬ උපදවා ගැනීමට යොදාගත් ආදේශක භාණ්ඩ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. එම ආදේශක භාණ්ඩ හඬ උපදවා ගැනීමට යොදාගැනීමේ වාසි 02 ක් ලියන්න. (ලකුණු 04)

iii. නාට්‍යමය අවස්ථා සඳහා හඬ යෙදීමේදී ආදේශක භාණ්ඩ යොදා ගන්නා අවස්ථා 3 ක් හා එයට අදාළ ආදේශක භාණ්ඩ ලියා දක්වන්න. (ලකුණු 06)

05. i. ඔබ දන්නා කතන්දරයක් සහ වේදිකා නාට්‍යයක් නම් කරන්න. (ලකුණු 02)

ii . වේදිකා නාට්‍යක් හා කතන්දරයක් අතර ඇති සමාන අසමානතා දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

iii. වේදිකා නාට්‍යක සුවිශේෂි ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 06)

06.



A



B



C



D

i. ඉහත රූප සටහන් මගින් දැක්වෙන අවස්ථා A/B/C/D පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

ii. ඉහත අවස්ථා 4 ට අදාළව පරිසරයේ සිදුවන වෙනස්කම් එක බැගින් ලියන්න. (ලකුණු 04)

iii. ඉන් එක් අවස්ථාවකට සුදුසු කවියක් නිර්මාණය කරන්න. (ලකුණු 06)

07. i. සිරිත් මල්දම කවි පන්තියෙන් ජීවිතයට ගතහැකි ආදර්ශ 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. ඔබ ඉහත දක්වන ලද එක් ආදර්ශයක් ඇතුළත් කවියක් සිරිත් මල්දම කවි ඇසුරින් ලියන්න. (ලකුණු 04)

iii. “සුදුසු තැනින් නිසි ලෙස පලයන්නේ” යන කවි පදය ඇතුළත් කවියට අදාළව කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න. (ලකුණු 06)

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440